# කෞශල්‍යා වොන්භාට්

ශ්ලේන් වේවලි

නොයෙකුත් අංක මගින් පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණ සහ ගති පැවතුම් හඳුනා ගැනීමට හැක. අංක ගණිතයට අනුව මෙය සාදා ගන්නා විවිධ ක්‍රම ඇත. සෑම අංකයකටම හිමි ලක්ෂණ ඇත.

ප්‍රථමයෙන් ඉලක්කම් වලින් ප්‍රකාශ කරන අරුත් හඳුනා ගමු.

1 මෙය ආදරයේවත් ආදරය පිළිබඳ හැඟීම්වත් ප්‍රකාශ කරන අංකයක් නොවේ. කෙනෙකුගේ පුද්ගලිකත්වය මෙම ඉලක්කමෙන් සංකේතවත් වේ. එලෙසම එක යනු තනිව නැගී සිටින ඉලක්කමකි. මෙම අකංය ඇති පුද්ගලයන් ඉතා ස්වාධීන පුද්ගලයන් බව ප්‍රකාශ වේ.

2 පුරාණ ඊජිප්තුවන් ඇඟිලි දෙකකින් :ඞ* යන්නෙන් ප්‍රකාශ කරන්නේ වාසනාවන්ත බවයි. දෙක අංකයෙන් යුග්ම බවද හැඟේ. අංක දෙක මගින් ස්ත්‍රී භාවයද හැඟවේ. අංක දෙක හිමි කෙනෙකුට ඕනෑම කම්කටොලු වලින් සෙරී ජීවත් වමට හැකියාව ඇත. එලෙසම මොවුන් කාරුණික සහ යහපත් අයවේ.

3 අංක තුන සෑම අවස්ථාවකම සුභවාදී අර්ථයක් ගෙන දේ. හින්දු ආගමේ ප්‍රධාන දෙවිවරු තුන්දෙනෙකු ඇති බව සැළකේ. බ්‍රහ්ම, විෂ්ණු සහ ශිව. පුරාණ ඊජිප්තුවන් දෙවිවරුන් තුන්දෙනෙකු ඇති බවට විශ්වාස කරයි. එනම් අය්සිස් :ෂිසි* ඔසරිස් :ධිසරසි* සහ හොරස් :ඍදරමී* ය. ක්‍රිස්තියානුවන්ටද අංක තුන විශේෂ වේ. එනම් ත්‍රිත්වයි :ඔරසබසළිහ*ග එලෙසම ජේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිටීම සිදුවූයේ දින තුනකට පසුවය. මව, පියා සහ දරුවා යන පවුලේ එකමුතු බව අංක තුන මගින් කියාපායි. අංක තුන හිමි අය ඉතා නිර්මාණශීලී සහ සැමවිටම ශුභවාදී ලෙස සිතීමට ආශා කරයි.

4 අංක හතර මගින් □ හැඩය පිළිඹිබු වේ. ජීවිතයේ ප්‍රධාන අවදි (ළමාවිය, තරුන විය, මැදිවිය සහ මහළු විය) සතරක් ඇති බව අංක හතර කියාපායි. ක්‍රිස්තියානු ආගමට අනුව 'ශුභ ආරංචිය' පතුරවන්නන් සතර දෙනෙකු සිටි බව ප්‍රකාශ වේ. (මැතිව්, මාක්, ලුක් සහ ජෝන්). එලෙසම සතර මහා භූතයෝ මෙම අංකයෙන් මනසට හැඟේ. අංක හතර හිමි අය ඉතා වෙහෙස වී වැඩකරන අය වේ. තවද, මොවුන් ක්‍රමානුකූලික අය වන අතර විටක දැඩි ගති අය විය හැක.

5 පුරාණ ග්‍රීක්වරුන් අංක පහ ආදරය සහ විවාහය සංකේත කරන බව විශ්වාස කරයි. අංක 2 ස්ත්‍රීභාවය සහ අංක 3 පුරුෂ භාවය කියාපායි. 2 + 3 = 5 සංයෝගය, ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා තහවුරු කරන බව හැඟේ. අංක පහ හිමි අය විවිධ සමර්ථකම් ඇති අයවන අතර සුභවාදී පුද්ගලයන් වේ.

6 අංක හය මඟින් ප්‍රකාශ වන්නේ එකමුතු බව, ආදරය සහ පවුලක් යන්නය. අංක 3 පුරුෂ භාවය සහ අංක 2 ස්ත්‍රීභාවය කියාපායි. 3 × 2 = 6. ස්ත්‍රී පුරුෂ එකමුතු බව යනු පවුලක් යන්නය. තවද තරුවක කෝන 6 සෑදී ඇත්තේ ත්‍රිකෝණ දෙකකිනි. ▲ උඩ අතට ඇති ත්‍රිකෝනය ප්‍රකාශ කරන්නේ ගින්දර, වාතය සහ පුරුෂ ශක්තියයි.

▼ යන ත්‍රිකෝණය නම් වතුර, පොළව සහ ස්ත්‍රී ශක්තිය ඉතාමත් වගකිව යුතු පුද්ගලයන්නය.

7 අංක හත විශේෂ අංකයකි. මාසයක් සෑදී ඇත්තේ දින හතේ සති හතරකිනි. අංක හත මුස්ලිම් ආගමේ සහ හින්දු ආගමේ ද විශේෂ ස්ථානයක් උසුලයි. අංක හත හිමි පුද්ගලයන් හඳුනා ගැනීමට අපහසුය. අංක හත ප්‍රඥාවේ සංකේතය බවද හැඟවේ. දෙවියන් වහන්සේ මේ ලෝකය නිර්මාණය කර ඇත්තේ දවස් හයකිනි. හත්වෙනි දවස විවේක ගෙන ඇත. අංක හත පූර්ණත්වයද සංකේතවත් කරයි.

8 අංක අටෙන් කියවෙන්නේ නැවත ආරම්භයයි. බෞතීස්මයේදී යොදා ගන්නා භාජනය පැති අටකින් යුක්තය. මෙය නැවත ආරම්භය සංකේතවත් කරයි. බෙත්ලෙහෙමේ පායා තිබූ තාරකාවද පැති අටකින් යුක්ත බව ප්‍රකාශ වේ. විශ්ණු දෙවියන්ට අත් අටක් ඇති බව සඳහන් වී ඇත. අංක අට හිමි අය ක්‍රියාශීලී වන අතර මුදල් ඉපයීමට දැඩි වෙහෙසක් දරයි. මොවුන් ත්‍යාගශීලී පුද්ගලයන් වන අතර දැඩි ගති පැවතුම් ඇත. එලෙසම ඉලක්කය කරා යන පුද්ගලයන්ය.

9 අංක නමය හීබ්‍රවරු :ඈඉරුඅි* විශ්වාස කරන්නේ සත්‍යයේ සංකේතය ලෙසයි. ක්‍රිස්තියානු ආගමේ ගීතිකා කණ්ඩායම් නමයක් තිබූ බව ප්‍රකාශ වේ. අංක නමය හිමි අය පරාර්ථකාමී පුද්ගලයන් වේ. මොවුන් කාරුණික සහ අනුන්ට උපකාරී වීමට ප්‍රිය කරයි. ත්‍යාගශීලි බවද මොවුන්ගේ ලක්ෂණයකි.

11 අංක 11 (5+6) අප්‍රිකානුවන් සලකන්නේ ඵලදායී භාවයේ සංකේතය ලෙසයි. ක්‍රිස්තියානුවන්ට අනුව අංක 11 විශ්වාසවන්ත භාවය හඟවයිග (විශ්වාසවන්ත දූතයන් 12 දෙනෙකු අතීතයේ සිට ඇත). මොවුන් සාධාරණ ලෝකයක් පිළිබඳ සිහන මවයි. අසීමිත හැකියාවන් ඇති අතර මෙවැනි පුද්ගලයන් ඉලක්කයන් කරා යෑමට සමත් වේ.

12 අංක ගණිතයට අනුව ප්‍රධාන අංකයකි. ඒබ්‍රෝ හෝඩියේ අකුරු 22 ඇත. අංක 12 හිමි අය ජීවිතයේ ඉලක්කයන් කරා යාමට ශූරයන්ය. එමනිසා අන්අය මවිත කිරී මට මොවුන්ට හැකිවේ.

## උපන්දිනය

උපන්දිනය මඟින් කෙනෙකුගේ ගති ලක්ෂණ වලින් 10% පමණ ප්‍රකාශ වේ. උපන්දිනය සාදා ගන්නා විට 11 සහ 22 ප්‍රධාන අංක වේ.
උදා :- උපන් දිනය 29 දින නම් 2 + 9 = 11.
මෙම පුද්ගලයාගේ අංකය 11 වේ.



# අංක විද්‍යාවෙන් පුද්ගලයෙකු හඳුනා ගනිමු

උපන්දිනය

උපන්දිනය මඟින් කෙනෙකුගේ ගති ලක්ෂණ වලින් 10% පමණ ප්‍රකාශ වේ. උපන්දිනය සාදා ගන්නා විට 11 සහ 22 ප්‍රධාන අංක වේ.
උදා :- උපන් දිනය 29 දින නම් 2 + 9 = 11.
මෙම පුද්ගලයාගේ අංකය 11 වේ.

**ස්වාභාවික හැකියාවන්**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| A | B | C | D | E | F | G | H | I |
| J | K | L | M | N | O | P | Q | R |
| S | T | U | V | W | X | Y | Z | - |

උදාහරණයක් ලෙස,

| K A T H Y | M A R Y | B R O W N |
|---|---|---|
| 2 + 1 + 2 + 8 + 7 | 4 + 1 + 9 +7 | 2 + 9 + 6 + 5 + 5 |
| 20 | 21 | 27 |
| 2 | 3 | 9 |

2 + 3 + 9 = 14 = 1 + 4 = 5 අංක 5

**ජීවන මඟ**

| | |
|---|---|
| උපන් මාසය | 10 |
| උපන් දිනය | 7 |
| උපන් අවුරුද්ද | 1954 |

මෙම ඉලක්කම් සියල්ල එකිනෙකට එකතු කරගත යුතුයි.

1 + 0 + 7 + 1 + 9 + 5 + 4 = 27 = 2 + 7 = 9

සෑම කෙනෙකුටම ජීවිතයේ අරමුණක් ඇත. ජීවිතයේ අරමුණු සොයා ගැනීමට මෙම ගණිත ක්‍රමයෙන් සොයා ගත හැකිය.

